THE WORLD BANK
IBRD • IDA | WORLD BANK GROUP

Funded by
The European Union

# අධි ඝනත්ව දෙපේළි ක්‍රමයට

# මිරිස්

# වගා කරමු.

HIGH DENSITY DOUBLE ROW

01

## තවාන් පාලනය

NURSERY MANAGEMENT



කෘෂිකර්ම අමාත්‍යාංශය,
කෘෂි අංශ නවීකරණ ව්‍යාපෘතිය

# 01. තවාන් පාලනය

1.1 තවාන් පාලනය

1.2 තවාන් මාධ්‍ය සකස් කරන ආකාරය



### අධි ඝනත්ව දෙපේළි ක්‍රමයට

# මිරිස්

## වගා කරමු



## ඔබ දන්නවාද අපේ

## මිරිස්

අවශ්‍යතාව සපුරා ගනු වස් විශාල විදේශ විනිමයක් වැය කරමින් පිටරට වලින් මිරිස් ආනයනය කරන බව

## මේ විශාල මුදල් ප්‍රමාණය රට තුළ ඉතිරි කර ගන්නට අපට හැකි ද?




## 1.1 තවාන් පාලනය

**නිරෝගී දිරිමත් තවාන් පැළයක් තුළින් නිරෝගී ගුණාත්මක වගාවක් බිහි කරගත හැකිය.**

## තවාන් තැටි හා කොකෝ පෙලට්ස් භාවිතයෙන් (කොහුබත් කැට)

නිරෝගී හා දිරිමත් මිරිස් පැළයක් ලබා ගැනීම සඳහා වඩාත් සුදුසුම තවාන් ක්‍රමය වන්නේ කොකෝ පෙලට් භාවිතා කිරීම තුළින් තවාන් නඩත්තු කිරීමයි. මෙහි ඇති විශේෂ වාසි වන්නේ ශාක පෝෂක එකතු කිරීමක් අවශ්‍ය නොවීමත්, පොලිතීන් වැනි පාරිසරික අපද්‍රව්‍ය ක්ෂේත්‍රය තුළට නොපැමිණීමත් සේම තවානේදී වැළඳෙන රෝගවලින් ආරක්ෂා වීමත්ය.

. 01



# මැස්සක් මත තවාන්
## Elevated Nursery

තවාන් තැටි රැඳවීම සඳහා සරල
මැස්සක් මත සකස් කළ ආරක්ෂිත
ගෘහයක් භාවිතා කරන්න..

මෙමඟින්,
තවාන් හැසිරවීම හා නිරීක්ෂණය
පහසු වීම,
රෝග, පළිබෝධ වැළදීමේ අවධානම
අඩු කර ගත හැකි වීම වගේම
සත්ත්ව හානි ද වළක්වා ගත හැකිය.



01




## 1.2 තවාන් මාධ්‍ය සකස් කරන ආකාරය
### (කොකෝ පෙලට් භාවිතා නොකරන්නේ නම්)

**කොහුබත්, කරදහයියා, වැලි, කොම්පෝස්ට් හා මතුපිට පස් සමාන ප්‍රමාණ වලින් මිශ්‍ර කර තවාන් මිශ්‍රනය සකස් කර ගනු ලබයි.**



- මෙම මිශ්‍රනයෙන් තවාන් තැටි පුරවා ගත යුතුය.
- මිරිස් බීජ තවාන් දැමීමට පෙර දින උදයේ ජලයේ පොඟවන්න.

- සවස දිය බේරෙන්නට තබා බීජ ප්‍රතිකාරකයක් සමඟ මිශ්‍ර කර පැය 12ක් තබන්න.

- පසුදා උදෑසන දිලීර නාශකයක් මිශ්‍ර කර මඳ පවනේ වියළා ගන්න.



- ඉන්පසු සෙ.මී 1/2 ගැඹුරින් තවාන් තැටි වල බීජ සිටුවා ගන්න.

- ඉන් පසු තවාන් මිශ්‍රනයෙන් වසා පිදුරු වසුනකින් ආවරණය කරන්න.



- ඉන්පසු දිලීර නාශක දියරයකින් තවාන හොඳින් තෙමන්න.

- ආරක්ෂිත ගෘහයක් තුළ මේ තවාන් තැටි තබන්න.




- දින 4කදී පමණ මිරිස් බීජ පැලවන විට පිදුරු වසුන ප්‍රවේශමෙන් ඉවත් කරන්න.

- දින 6 කදී පමණ තවාන සූර්යාලෝකයට නිරාවරණය කිරීම ආරම්භ කරන අතර උදෑසන 8.00 පමණ වන තෙක් තවාන් තැටිවලට සූර්යාලෝකය ලබා දිය යුතුය.

- දින 7,8,9 වන විට දිනකට පැය භාගයක් පමණ සූර්යාලෝකයට නිරාවරණය කරන්න.

- දින 12කට පසු පස්වරු 12 සිට පස්වරු 2.00 අතර කාලය සෙවණ සැපයිය යුතු අතර ඉතිරි කාලය සූර්යාලෝකයට නිරාවරණය කළ යුතුය.



- සූර්යාලෝකයට නිරාවරණය වන විට තවාන් පැළ දැඩි වන අතර දින 12 සිට 28 දක්වා පැළ ක්ෂේත්‍රයේ සිටුවිය හැක.

- M I C H Hybrid 01 ප්‍රභේදය සීඝ්‍ර වර්ධනයක් සහිත ය



- දින 28කට පෙර අනිවාර්යයෙන් පැළ ක්ෂේත්‍රයේ සිටුවිය යුතුය, නැතහොත් පැළවල වර්ධනය බාල වේ.



අධි ඝනත්ව දෙපේළි ක්‍රමයට

# මිරිස් වගා කරමු.

## ප්‍රකාශන කට්ටලය

1. තවාන් පාලනය
2. අධි ගණත්ව දෙපේළි ක්‍රමයට මිරිස් වගා කරමු.
3. අධි ගණත්ව දෙපේළි ක්‍රමයට මිරිස් වගා කරමු.
4. ක්ෂේත්‍ර සනීපාරක්ෂාව හා රෝග පළිබෝධ පාලනය
5. අස්වනු නෙළීම හා සැකසීම

අධි ඝනත්ව දෙපේළි ක්‍රමයට

# මිරිස්

## වගා කරමු.



## තවාන් පාලනය

NURSERY MANAGEMENT